# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka
## EXTRAORDINARY

**අංක 1787/27 - 2012 දෙසැම්බර් මස 05 වැනි බදාදා - 2012.12.05**

No. 1787/27 - WEDNESDAY, DECEMBER 05, 2012

**(Published by Authority)**


එල්. ඩී. බී. 21/78 iv.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, මේ නියමය මගින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ ඇතිව, ඉහත කී පනතේ 27 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වෙන් වෙන්ව පිළිවෙලින් සාදනු ලැබූ 2005 සැප්තැම්බර් මස 30 වන දින අංක 1412/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ 2011 ජුනි මස 24 වැනි දින අංක 1711/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියම මගින් පසුව සංශෝධිත ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ 1996 මාර්තු මස 27 වැනි දින අංක 916/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය මෙයින් පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 2005 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 1412/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ (1) වැනි අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

" (ඈ) මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පීඨ එම විශ්වවිද්‍යාලයට පවරාදීම ; සහ " ;

(2) 1996 මාර්තු මස 27 වැනි දින අංක 916/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ (ඉ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

" (ඉ) මෙහි II වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති එම විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨය එකී උපලේඛනයෙ II වැනි තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති අධ්‍යයන අංශ වලින් සමන්විත විය යුතු බවට නිශ්චිතව දන්වමි.";

(3) 2011 ජූනි මස 24 වැනි දින අංක 1711/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ (1) වැනි අයිතමයේ අන්තර්ගත වන උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :-

" I වැනි උපලේඛනය

අග්නිදිග විශ්වවිද්‍යාලයට පවරා ඇති පීඨයන්

1. කලා සහ සංස්කෘතික පීඨය.
2. කළමනාකරණ සහ වාණිජ පීඨය.
3. ව්‍යවහාරික විද්‍යා පීඨය.
4. ඉස්ලාම් අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය.
5. ඉංජිනේරු පීඨය.

## II වැනි උපලේඛනය

### එක් එක් පීඨයේ අධ්‍යයන අංශය

| *I වැනි තීරය*<br>*පීඨය* | *II වැනි තීරය*<br>*අධ්‍යයන අංශය* |
|---|---|
| 1. කලා සහ සංස්කෘතික පීඨය | අ. සමාජ විද්‍යා අධ්‍යයන අංශය. |
| | ආ. භාෂා අධ්‍යයන අංශය. |
| | ඇ. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය. |
| 2. කළමනාකරණ සහ වාණිජ පීඨය | අ. කළමනාකරණ අධ්‍යයන අංශය. |
| | ආ. ගණකාධිකරණ සහ මූල්‍ය අධ්‍යයන අංශය. |
| 3. ව්‍යාපාරික විද්‍යා පීඨය | අ. ජීව විද්‍යා අධ්‍යයන අංශය. |
| | ආ. භෞතික විද්‍යා අධ්‍යයන අංශය. |
| | ඇ. ගණිත විද්‍යා අධ්‍යයන අංශය. |
| 4. ඉස්ලාම් අධ්‍යයන සහ අරාබි භාෂා පීඨය | අ. ඉස්ලාම් අධ්‍යයන අංශය. |
| | ආ. අරාබි භාෂා අධ්‍යයන අංශය. |
| 5. ඉංජිනේරු පීඨය | අ. සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය. |
| | ආ. පරිගණක විද්‍යා සහ ඉංජිනේරු අධ්‍යයන අංශය. |
| | ඇ. යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය. |
| | ඈ. විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයන අංශය. |
| | ඉ. අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන අංශය.” ; |

(4) 2005 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 1412/35 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සාදනු ලැබූ නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

12 - 537